සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014(2015)

## (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය

පැය දෙකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



* **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**
**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.**

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

**වැදගත් :**

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු **11** කින් හා ප්‍රශ්න **75** කින් යුක්ත වේ.

* පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය දෙකකි.**

* ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

* **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

* ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල් හෝ කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**

* මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

* **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 9 | |
| 3 | 10 - 20 | |
| 4 | 21 - 28 | |
| 5 | 29 - 37 | |
| 6 | 38 - 45 | |
| 7 | 46 - 54 | |
| 8 | 55 - 61 | |
| 9 | 62 - 66 | |
| 10 | 67 - 72 | |
| 11 | 73 - 75 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

- අංක 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. පරිගණකයක අත්‍යවශ්‍ය උපාංගයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) Monitor (2) CPU (3) CD-ROM (4) Memory (.........)

2. ප්‍රධාන මතකයේ (main memory) ආවයන ධාරිතාව, සත්‍ය ධාරිතාව ඉක්මවා ඉහළ නංවන ක්‍රමය කුමක් ද?
   (1) multitasking (2) virtual storage
   (3) multiprocessing (4) switching (.........)

3. ආදාන මෙන්ම ප්‍රතිදාන උපාංගයක් ලෙස භාවිත කළ හැක්කේ පහත කවරක් ද?
   (1) යතුරු පුවරුව (2) ස්පර්ශ සංවේදී තිරය
   (3) සුපරීක්ෂකය (scanner) (4) මවුසය (.........)

4. මෘදුකාංග ස්ථාපනය කරන විට (install) අවශ්‍ය සංරචක පමණක් තෝරා ගැනීමට අවකාශ සලසන්නේ කුමන ස්ථාපන විකල්පය ද?
   (1) Typical (2) Portable (3) Full (4) Custom (.........)

5. "මෘදුකාංගයක් යනු, කළයුතු කාර්යය කුමක් ද යන්න ......... වෙත උපදෙස් දෙන ඕනෑම ......... කි."
   මෙම ප්‍රකාශයේ හිස්තැන් පිරවීමට වඩාත්ම සුදුසු වචන දෙක පිළිවෙළින් ඇතුළත් යුගලය මින් කුමක්ද?
   (1) වැඩසටහන, උපාංගය (2) කේතය, දෘඩාංග
   (3) උපදේශය, මධ්‍ය සැකසුම් ඒකකය (4) උපදෙස් මාලාව, දෘඩාංග (.........)

6. මුද්‍රණ ලැයිස්තුවක (print queue) ඇතුළත් වන්නේ ........................ ලැයිස්තුවකි.
   (1) එම මුද්‍රණ යන්ත්‍රය භාවිත කිරීමට අවසර ඇති සියලු පරිශීලකයන්ගේ
   (2) දිනය තුළ කාර්යාලයේ භාවිත කරන ලද මුද්‍රණ යන්ත්‍රවල
   (3) සියලු පරිශීලකයන් විසින් මෙම මුද්‍රණ යන්ත්‍රය භාවිත කරමින් මුද්‍රණය කිරීමට විධාන කර ඇති ලේඛනවල
   (4) දිනය තුළ එම මුද්‍රණ යන්ත්‍රයෙන් මුද්‍රණය කළ ලේඛනවල (.........)

7. පරිගණකයේ මව්පුවරුවේ බැටරිය දෝෂ සහිත බව දැක්වෙන්නේ පහත කවරක් මගින් ද?
   (1) මෙහෙයුම් පද්ධති මුරපද (system passwords) අක්‍රිය වේ.
   (2) දෘඪ තැටියේ ඇති ගොනුවල විකෘති හෝ හානි සිදුවේ.
   (3) අතථ්‍ය මතකයේ (virtual memory) සැකසුම්, පෙරනිමි (default) අගයයන්ට වෙනස් කෙරේ.
   (4) ප්‍රවර්තන දිනය හා වේලාව පෙරනිමි අගයයන්ට වෙනස් කෙරේ. (.........)

8. ස්විචයක් (switch), නාභියකට (hub) වඩා වාසිදායක වන්නේ පහත කවරක් නිසා ද?
   (1) ජාල තදබදය (network traffic) අඩු කිරීම
   (2) වෛරස පැතිරීම වැළැක්වීම
   (3) අන්තර්ජාලයට සෘජුව පරිගණකය සම්බන්ධ කිරීම
   (4) වැඩ නිකේතනයෙහි (workstation) මුරපද ආරක්ෂාව කළමනාකරණය කිරීම (.........)

9. පහත වගන්ති අතුරින් 'පඨන මාත්‍ර මතකය (Read Only Memory - ROM)' පිළිබඳව සත්‍ය වගන්තිය කුමක් ද?
   (1) යෙදවුම් මෘදුකාංගවලට මෙම මතකයට දත්ත ඇතුළත් කිරීමට හැකිය.
   (2) පරිගණකය වසා දැමුව ද (switched off) ROM තුළ අන්තර්ගතය මැකී නොයයි.
   (3) වෙබ් පිටු බාගත (download) කරන අවස්ථාවේ ROM තුළ තැන්පත් කෙරේ.
   (4) පරිගණකය වසා දමන විට, ROM අන්තර්ගතය මැකී යයි. (.........)

2562

10. Zip ගොනුවක් යනු ………….. ගොනුවකි.
(1) සංකුචිත (compressed) (2) පද්ධති (system)
(3) වැඩසටහන් (program) (4) විධානීය (executable) (………)

11. pen drive, thumb drive, key drive හෝ jump drive ආදි විවිධ නම්වලින් හැඳින්වෙන ..........., එක් පරිගණකයක සිට ඡායාරූප වෙනත් පරිගණකයකට ගෙන යාමට ඇති අනර්ඝ ක්‍රමයකි.
(1) ඇඟිලි උපාංගය (USB flash drive) (2) දෘඪ ඩිස්කය
(3) සංගත තැටිය (CD ROM) (4) DVD (………)

12. අන්තර්ජාලය ක්‍රියාත්මක වන්නේ ………………….. ප්‍රොටෝකෝලය මත ය.
(1) http (2) ftp (3) tcp/ip (4) ip (………)

13. http යනුවෙන් කෙටි කොට දැක්වෙන්නේ
(1) hot text termination protocol. (2) high text transfer protocol.
(3) hyper text transfer protocol. (4) high text termination protocol. (………)

14. ප්‍රති-වෛරස මෘදුකාංගයක කාර්යයක් නොවන්නේ මින් කුමක් ද?
(1) එය අන්තර්ජාලය තුළදී ආරක්ෂාව ඇති කරයි.
(2) එමගින්, පරිගණකය වෙත පැමිණෙන සියලු ගොනු සුපරීක්ෂණය (scan) කරයි.
(3) එමගින් ඔබේ පරිගණකය වෙත වෛරස ඇතුළුවීම වළකාලයි.
(4) එමගින්, ගොනු බාගත කිරීම් වඩාත් කාර්යක්ෂම කරයි. (………)

15. Facebook යනු ………………………………….. ජාලයකි.
(1) සන්නිවේදන (2) මෘදුකාංග (3) මාධ්‍ය (4) සමාජ (………)

16. අනැවැසි ඊමේල් (junk email) පණිවුඩයක් යනු,
(1) වෛරසයකි. (2) spam පණිවුඩයකි.
(3) ඇමුණුමකි (attachment). (4) චිත්‍රපටයකි. (………)

17. URL සම්බන්ධයෙන් සත්‍ය වන්නේ මින් කුමක් ද?
(1) URL යනුවෙන් කෙටියෙන් දැක්වෙන්නේ 'Universal Resource Locator' යන්නයි.
(2) එමගින් ගොනුවක, නාමාවලි මංපෙත (directory path) දක්වයි.
(3) IP ලිපිනයට එහි සබඳතාවක් නැත.
(4) URL භාවිත කරමින් අපට වෙබ් අඩවියකට පිවිසිය හැකිය. (………)

18. සම්භාෂණය (Chatting) සඳහා භාවිත කළ නොහැක්කේ මින් කුමක් ද?
(1) Google (2) Yahoo (3) Skype (4) Linux (………)

19. 'WWW' යන්න සම්බන්ධයෙන් සත්‍ය වගන්තියක් නොවන්නේ මින් කුමක් ද?
(1) වෙබ් ලිපිනයක් WWW යනුවෙන් ආරම්භ විය යුතුය.
(2) එය වෙබ් පිටු මිලියන ගණනාවක එකතුවකි.
(3) WWW යන්න වෙබ් ලිපිනයක කොතැනක හෝ අඩංගු විය හැකිය.
(4) එහි වීඩියෝ සහ ශබ්ද ගොනු තිබිය හැකිය. (………)

20. පහත කවරක් ඊමේල් පණිවුඩය තුළ ලිපිනය ප්‍රදර්ශනය නොකරම යම් ලබන්නකු වෙත යවන ඊමේල් පණිවුඩ පිටපතක් වන්නේ ද?
(1) CC (2) To (3) BCC (4) Sender (………)